(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

**අංක 90.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2016 අගෝස්තු මස 11 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 10.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

375/’15

1.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) වර්ෂ 2005 සිට 2015 දක්වා වසරවල එක්සත් ජාතීන්ගේ මහ සමුළුවට (General Assembly) සහභාගී වූ ශ්‍රී ලාංකික නියෝජිත කණ්ඩායම්වල,

(i) ප්‍රධානත්වය දැරුවේ කවුරුන්ද;

(ii) නියෝජිතයින් සංඛ්‍යාව කවරේද;

(iii) ඒ අතර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සිටියේ නම්, ඔවුන්ගේ නම් කවරේද;

(iv) විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(v) වැය කළ මුළු මුදල කොපමණද;

(vi) එම වියදම ගුවන් ගමන්, හෝටල් හා නවාතැන් වියදම් ලෙස එක් එක් ශීර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

387/’15

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේදී යුධ හමුදාවට ශාරීරික අභ්‍යාස සඳහා අවශ්‍ය කැන්වස් සපත්තු මිලදී ගැනීමට ටෙන්ඩර් කැඳවූ අවස්ථාවේ ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ ආයතන කවරේද;

(ii) එම ආයතන ඉදිරිපත් කළ ටෙන්ඩර් වටිනාකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ටෙන්ඩරය ලබාගත් ආයතනය කවරේද;

(iv) එම ආයතනයට ටෙන්ඩරය ලබාදීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2015 වර්ෂයේදී මෙම සපත්තු මිලදී ගැනීමට අදාළ ආරක්ෂක අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සිටි නිලධාරීන්ගේ නම් හා තනතුරු කවරේද;

(ii) මෙම නිලධාරීන් ටෙන්ඩර් මණ්ඩලයේ කොපමණ කාලයක සිට කටයුතු කරන්නේද;

(iii) 2015 වර්ෂයේදී මෙම සපත්තු මිලදී ගැනීමට අදාළ යුධ හමුදා ටෙන්ඩර් මණ්ඩලයේ සිටි නිලධාරින්ගේ නම් හා තනතුරු කවරේද;

(iv) මෙම නිලධාරින් ටෙන්ඩර් මණ්ඩලයේ කොපමණ කාලයක සිට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ආරක්ෂක අමාත්‍යාංශය හා යුධ හමුදා ටෙන්ඩර් මණ්ඩලවල අඛණ්ඩව සේවය කරන නිලධාරින් ඉවත් කිරීමට රජය කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවර දිනයකදීද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

509/'16

3.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) සුනාමි ව්‍යසනය නිසා දිවයිනේ විවිධ පළාත්වල නිවාස හා දේපළ අහිමි වූ පවුල් ගණනාවක් මේ වනවිටත් අසරණභාවයෙන් පසුවන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නිවාස අහිමිවී සිටින පුද්ගලයින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් තෝරාගෙන ඔවුන්ට ස්ථිර නිවාස ලබාදීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද;

(ii) ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය ඒකාබද්ධව එම වැඩපිළිවෙළ ක්‍රියාවට නැංවීම කෙරෙහි අවධානය යොමු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

554/'16

4.

ගරු සෙය්යිඩ් අලී සාහිර් මවුලානා මහතා,— තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂයේදී තැපැල් දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ තැපැල් සේවයේ, ''ආ'' කාණ්ඩයේ 1 ''ආ'' ශ්‍රේණියේ, ''තැපැල් සේවා නිලධාරි'' තනතුරට බඳවා ගැනීම සඳහා පැවැත්වූ තරඟ විභාගයට පෙනී සිටි (විභාග අංකය - PS/C/05264) දෙහිඅත්තකණ්ඩිය, රන්හෙලගම, අංක 159 දරන ලිපිනයේ පදිංචි, එන්. ජී. සුනිල් ශාන්ත මහතා එම විභාගයෙන් සමත් වී ඇති බවත්;

(ii) එසේ වුවද , ඔහු මේ වනතෙක් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) තරඟ විභාගයෙන් ලබා ගෙන ඇති ලකුණු සැලකිල්ලට ගෙන, ඔහු එම තනතුරට පත්කිරීම සඳහා සලකා බලන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

592/'16

5.

ගරු ලකී ජයවර්ධන මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත්ව තිබී 1994.12.31 දින සිට මේ දක්වා කාලය තුළ විවිධ පුද්ගලයන්ට සහ ආයතනවලට ලබා දී ඇති මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටි ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් ලබා දී ඇති පුද්ගලයින් සහ ආයතන, පිහිටි ස්ථාන, ප්‍රමාණයන් සහ වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් ලබාදීමෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට ලැබී ඇති මුළු ආදායම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ඉඩම්වලින්, මේ වනවිට සංවර්ධනය කර හා නොකර ඇති ඉඩම් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ජාතික ආර්ථිකයට දායකත්වයක් ලබා දිය හැකි එහෙත් නිසි සංවර්ධනයක් සිදුකර නොමැති ඉඩම් නැවත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පවරා ගැනීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

613/'16

6.

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2008 සිට 2015 දක්වා කාලය තුළ පළාත් පාසල්වල වැඩ බැලීමේ පදනම මත පත් කරනු ලැබූ විදුහල්පතිවරුන් 4000ක් පමණ පාසල්වල මූල්‍ය කටයුතු සහ පරිපාලන කටයුතු පිළිබඳව දැනුම හා පුහුණුවීම් ලබාගෙන ඇති බවත්;

(ii) විදුහල්පති සේවයට බඳවා ගැනීමේ තරඟ විභාගය වර්ෂ 2005න් පසුව 3 වන ශ්‍රේණිය සඳහා පමණක් 2015 දී පවත්වා ඇති බවත්;

(iii) එම විභාගයට පෙනී සිටීම සඳහා අවුරුදු 50 ඉක්මවූවන්ට අවස්ථාව ලබා දී නොමැති අතර 3 වන ශ්‍රේණියේ විදුහල්පති තනතුරට වඩා ඉහළ වැටුප් තලයක සිටි ගුරුවරුන් බොහෝ දෙනෙකු ඉදිරිපත්ව නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) විදුහල්පති සේවා ව්‍යවස්ථාව අනුව, අවුරුදු 03කට වඩා කාලසීමාවක් එම පදනම මත සේවය කළ අය සම්මුඛ පරීක්ෂණ මඟින් පත්කළ යුතු වුවත්, මේ වනතුරු රජයේ පාසල්වල වැඩ බලන විදුහල්පතිවරුන්ගේ සේවය ස්ථිර නොකිරීමට හේතුව කවරේද;

(ii) තරඟ විභාගයට හෝ පෙනී සිටීමට අවස්ථාව නොලද අවුරුදු 50 ඉක්මවූ වැඩ බලන විදුහල්පතිවරුන්ගේ සේවය ස්ථිර කිරීමට පියවර ගන්නේද;

(iii) පසුගිය රජය සමයේ දේශපාලන පළිගැනීම්වලට ලක්වූවන් සඳහා සහන සලසන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

620/'16

7.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්හි,

(i) නොමිලේ පවත්වන පාඨමාලා සංඛ්‍යාව කොපමණද; එම පාඨමාලා කවරේද;

(ii) මුදල් අයකර පවත්වනු ලබන පාඨමාලා සංඛ්‍යාව කොපමණද; එම පාඨමාලා කවරේද;

(iii) ඉල්ලුම් කරන සුදුසුකම් ඇති සියලු සිසුන් පාඨමාලා සඳහා ඇතුළත්කර ගන්නේද;

(iv) පහසුකම් ප්‍රමාණවත් නොවන පාඨමාලා කවරේද;

(v) ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පහසුකම් වැඩිකළහොත් බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය වැඩිවන බව පිළිගන්නේද;

(ii) සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන එම අවශ්‍යතා සපුරාලීම සඳහා පහසුකම් වැඩි කරනු ලබන දිනය කවරේද;

(iii) "මෘදු කුසලතාවයන්ගේ සංවර්ධන අවශ්‍යතාවය හඳුනාගෙන එම අවශ්‍යතා සපුරාලීම සඳහා කටයුතු කරමින් පවතී" යන්නෙන් අදහස් කරන භෞතික ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

621/'16

8.

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වංචා හා දූෂණ චෝදනා රාශියක් සම්බන්ධයෙන් ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයාට එරෙහිව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට පැමිණිලි කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ප්‍රධාන අමාත්‍යවරයා විසින් උපදේශකයින් බඳවාගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ කවර බලතල යටතේද;

(iii) බඳවාගෙන ඇති උපදේශකවරයන්/උපදේශකවරියන්ගේ නම් හා ඔවුන්ට ගෙවන දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම පුද්ගලයින් නීතිවිරෝධීව බඳවාගෙන තිබේ නම්, ඔවුන් ඉවත් කිරීමට හා ඒ සම්බන්ධයෙන් ප්‍රධාන අමාත්‍යවරයාට එරෙහිව නීත්‍යානුකූල පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

626/'16

9.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 අයවැය යෝජනා යටතේ බදු ගෙවන්නන් දිරි ගැන්වීම සඳහා අඛණ්ඩව වසර 10ක් අවම වශයෙන් වසරකට රු.250,000/-ක බදු ගෙවා ඇති පුද්ගලයින් විසින් වාහනයක් මිලදී ගැනීමේදී ඒ සඳහා අය කරන බද්දෙන් 25%ක බදු සහනයක් ලබා දී ඇති බවත්;

(ii) එම බදු සහනය අහෝසි කරන මෙන් 2015 සැප්තැම්බර් මාසයේදී මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලිපියකින් දන්වා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වරප්‍රසාදය අහිමි කිරීමට හේතු කවරේද;

(ii) එම වරප්‍රසාදය අහෝසි කරන අවස්ථාව වනවිටත් වාහන ගෙන්වීම සඳහා ණයවර ලිපි ආරම්භ කර අපහසුතාවයට ලක්වී සිටින පුද්ගලයන්ට ලබා දෙන සහනය කවරේද;

(iii) මෙම බදු සහනය ලබා දීම පිණිස පවතින නිර්ණායක සමාලෝචනය කර ඉදිරි කාලයේදී එය නැවත ලබා දීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ පිළිබඳව සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

630/'16

10.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2001 – 2004 දක්වා පැවති එක්සත් ජාතික පක්ෂ රජය විසින් දීර්ඝකාලීන බදු පදනම මත පෞද්ගලික සමාගම් හෝ පුද්ගලයින් වෙත ලබාදී ඇති ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් කොළඹ, වොක්ෂෝල් වීදියේ පිහිටි, ගබඩා සංකීර්ණ සංඛ්‍යාව කොපමණද;

(ii) බදු දී ඇති ගබඩාවේ නම, වර්ග අඩි ප්‍රමාණය, බදු දුන් මුදල සහ බදු දුන් සමාගම හෝ පුද්ගලයාගේ නම, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ගබඩා බදු දී ඇත්තේ අමාත්‍ය මණ්ඩල අනුමතියකට, විවෘත ටෙන්ඩර් පටිපාටියකට හෝ රජයේ තක්සේරුවකට යටත්වද;

(ii) එවැනි කොන්දේසි කිසිවක් නොමැතිව මෙම ගබඩා බදු දී ඇත්නම්, ඒවා නැවත රජයට පවරා ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

633/'16

11.

ගරු ජයන්ත සමරවීර මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 1948 පෙබරවාරි 04 දින සිට 2016 මාර්තු 24 දක්වා කාලය තුළ මරණීය දණ්ඩනය හෝ ජීවිතාන්තය දක්වා සිරදඬුවම් නියම වූ පුද්ගලයින් සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මරණීය දණ්ඩනයට හෝ ජීවිතාන්තය දක්වා සිරදඬුවම් නියම වූ සිරකරුවන්ගේ නම, ලිපිනය හා එවැනි දඬුවමක් නියම කිරීමට එකී සිරකරුවන් සිදුකළ වරද කුමක්ද යන්න එක් එක් සිරකරුවා අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) මරණ දඬුවම හෝ ජීවිතාන්තය දක්වා සිරදඬුවම් ලබා සිටි සිරකරුවන් සඳහා විශේෂ සමාවක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, විශේෂ සමාව ප්‍රදානය කරනු ලැබුවේ කවුරුන් විසින් කවර දිනයකදී, කවර දඬුවමකට ලක්ව සිටි, කවර සිරකරුවන්ටද යන්න වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

641/'16

12\.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ පුරෝකථනයන් අනුව 2016 වර්ෂයේ සමස්ත විදේශ විනිමය ලැබීම් සහ ගෙවීම් කොපමණද;

(ii) 2016 වර්ෂය සඳහා පුරෝකථනය කරන ලද ගෙවුම් ශේෂ හිඟය කොපමණද;

(iii) එම ගෙවුම් ශේෂ හිඟය පියවා ගැනීම සඳහා රජය විසින් ගැනීමට අපේක්ෂා කරන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

700/'16

13\.

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ 3, ඇල්ප්‍රඩ් හවුස් ගාඩන්හි, අංක 10, ප්‍රින්ස් ඇල්ප්‍රඩ් ටවර් යන ලිපිනයෙහි, පදිංචි අර්ජුන ජෝශප් ඇලොසියස් මහතා, ඩබ්ලිව්. එම්. මෙන්ඩිස් අරක්කු නිෂ්පාදන සමාගමෙහි අධ්‍යක්ෂවරයෙකු වශයෙන්, ධාන්‍ය මඟින් ස්ප්‍රීත්තු පෙරීමේ බලපත්‍රයක් (එතනෝල් බලපත්‍රය) දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම්කර තිබේද;

(ii) එසේ නොවේ නම්, ඩබ්ලිව්. එම්. මෙන්ඩිස් සහ සමාගම විසින් එවැනි බලපත්‍රයක් ඉල්ලුම් කර තිබේද;

(iii) ඩබ්ලිව්. එම්. මෙන්ඩිස් සහ සමාගමෙහි අධ්‍යක්ෂවරුන් කවරේද;

(iv) 2015.01.08 දිනයෙන් පසු මේ දක්වා ධාන්‍ය මඟින් ස්ප්‍රීත්තු පෙරීමේ බලපත්‍ර (එතනෝල් බලපත්‍ර) කොපමණ ප්‍රමාණයක් සුරාබදු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර තිබේද, ඒ කවර පුද්ගලයන් / ආයතන වෙනුවෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

702/'16

14\.

ගරු විජිත හේරත් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ සේවකයන් සඳහා යතුරුපැදි ලබාදීමේ වැඩපිළිවෙළට පවුල් සෞඛ්‍ය සේවා නිලධාරින් ඇතුළත් බවත්;

(ii) ක්ෂේත්‍ර සහ රෝහල් රාජකාරියේ යෙදී සිටින දෙපිරිසටම මෙම පහසුකම හිමි බවත්;

(iii) යම් පළාත්වල යතුරුපැදි ලබාදීම නිසි පරිදි සිදුවී ඇතත්, පළාත් කිහිපයක එය නිසි පරිදි ක්‍රියාත්මක වී නොමැති බවත්;

(iv) විශේෂයෙන් ගම්පහ රෝහලේ සේවයේ නියුතු පවුල් සෞඛ්‍ය සේවා නිලධාරින් සඳහා මේ වනතුරුත් යතුරුපැදි ලබාදීම සිදුවී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ගම්පහ ඇතුළු දිවයින පුරා එම යතුරුපැදි නොලද සැමට යතුරුපැදි ලබාදීම සඳහා පියවර ගන්නේද;

(ii) ඒ සඳහා ගතවිය හැකි කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

388/’15

15.

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආයුර්වේද උපාධිය සම්පූර්ණ කළ දහසකට අධික පිරිසක් රැකියා විරහිතව සිටින බවත්;

(ii) ඔවුන්ට රැකියා ලබා දීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් මෙතෙක් ක්‍රියාත්මක වී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය අංශයේ දැනට ආයුර්වේද වෛද්‍ය පුරප්පාඩු තිබේද;

(ii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iii) ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන්ගේ විරැකියා ගැටලුව විසඳීමට එතුමා කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## **යෝජනා පිළිබඳ දැනුම්දීම**

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— 2016.03.08 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, 2016 අගෝස්තු මස 12 වැනි සිකුරාදා දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.30 සිට අ. භා. 6.30 දක්වා ද විය යුතු ය. පූ. භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය. අ. භා. 6.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2016 අගෝස්තු මස 12 වැනි සිකුරාදා පූ. භා. 9.30 වන තෙක් කල් තැබිය යුතු ය.

3.

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

“සැමට සරණ සහන සේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.”

4\.

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"සත්‍ය ශ්‍රී ගණපති භක්ති ජන සේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

5\.

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 3),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"බර්ටි දිසානායක පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

සත්ව ආහාර (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— 2016 ජූනි 22 දිනැති අංක 1972/33 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින්, සිංහල හා දෙමළ භාෂා පිටපත්වල මුද්‍රණ දෝෂ නිවැරදි කරනු ලැබූ, මෝටර් වාහන පනතේ (203 වැනි අධිකාරය වූ) 122 වගන්තිය සහ VII අ කොටස සමඟ කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 නොවැම්බර් 02 දිනැති අංක 1939/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.07.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරියගේ වැටුප හා දීමනා ප්‍රතිශෝධනය කිරීම,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16 (1) වගන්තිය අනුව කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යයන් ඉටුකරලීම පිණිස එම කොමිෂන් සභාවට සහාය වීමට අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත්කිරීමට සහ එම තනතුර දරන තැනැත්තාට පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන වැටුපක් ගෙවීමට විධිවිධාන සලස්වා දී ඇති හෙයින්ද;

අවදානමක් දැරිය යුතු තනතුරක් වන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට 2015.02.12 දින රජයේ අවශ්‍යතාවය මත නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල් ධූරයේ රාජකාරි කළ ජනාධිපති නීතිඥ ඒ. ඒ. පී. දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය පත්කිරීම මත, ඇයට පෞද්ගලික වන සේ පහත සඳහන් වැටුප් හා දීමනා 2015.02.12 දින සිට ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) අතිරේක සොලිසිටර් ජනරාල් තනතුරට හිමි මාසික වැටුප සහ සියලු දීමනා (දුරකථන දීමනාව, ඉන්ධන දීමනාව සහ නිවාස කුලී දීමනාව හැර);

සහ

(ආ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ධූරයට හිමි අමාත්‍යාංශ ලේකම් දීමනාව, දුරකථන දීමනාව, ඉන්ධන දීමනාව හා රජයේ නිල නිවාසයක් ලබාදී නොමැති නම් නිවාස කුලී දීමනාව.

ඊට අනුකූලව, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16 (2) වගන්තිය ප්‍රකාරව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්, ජනාධිපති නීතිඥ ඒ. ඒ. පී. දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරයන් හා සාමාජිකයින් වෙත ගෙවනු ලබන පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා,— දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් ස්වාධීන කොමිෂන් සභා නවයෙහි සභාපතිවරයන් හා සාමාජිකයින් වෙත පහත සඳහන් පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා, අදාළ කොමිෂන් සභා සත්‍ය වශයෙන්ම රාජකාරි ආරම්භ කරන ලද දිනය, අදාළ ගෙවීම් බලාත්මක වන දිනය ලෙස සලකමින් ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) නිල බලයෙන් පත්වන සභාපතිවරයන් හැර අනෙකුත් සභාපතිවරයන් සඳහා රු. 100,000/-ක මාසික දීමනාවක් ද, රු. 10,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, පෞද්ගලික භාවිතයට ද හිමිකම් සහිත නිල වාහනයක් සහ එකී වාහනය සඳහා ඉන්ධන ලීටර් 225ක් හෝ වෙළඳපොළේ පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව දීමනාවක්ද;

(ආ) නිල බලයෙන් පත්වන ස්වාධීන කොමිෂන් සභා සභාපතිවරයන් සඳහා තම නිත්‍ය තනතුරේ වැටුප් හා දීමනාවලට අතිරේකව, ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරයෙකුගේ මාසික දීමනාවෙන් 50%ක මාසික දීමනාවක්ද;

(ඇ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂන් සභාවේ හැර අනෙකුත් ස්වාධීන කොමිෂන් සභාවල නිල බලයෙන් පත් නොවන සාමාජිකයින් සඳහා රු. 75,000/-ක මාසික දීමනාවක්ද, රු. 8,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, තම පදිංචි ස්ථානයේ සිට කොමිෂන් සභා කාර්යාලයට යාමට ඇති දුර ප්‍රමාණය අනුව කිලෝ මීටර් 350 දක්වා රු. 25,000/-ක ප්‍රවාහන දීමනාවක් හෝ කිලෝ මීටර් 350ට වැඩි දුර ප්‍රමාණයක් වෙනුවෙන් රු. 50,000/-ක ප්‍රවාහන දීමනාවක්ද;

(ඈ) 2015.06.17 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 3/2015 විධිවිධාන පරිදි නිල බලයෙන් පත්වන සාමාජිකයින් සඳහා එක් රැස්වීම් වාරයකට සහභාගි වීම වෙනුවෙන් රු. 10,000/-ක දීමනාවක්ද;

(ඉ) 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ (8) වැනි වගන්තියට අනුව එම කොමිෂන් සභාවේ සභාපතිට හා සමානව සාමාජිකයින්ට ද බලතල පැවරී ඇති බැවින්, එම කොමිෂන් සභාවේ සාමාජිකයින්ට රු. 95,000/-ක මාසික දීමනාවක් ද, රු. 8,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, පෞද්ගලික භාවිතයට ද හිමිකම් සහිත නිල වාහනයක් හා එම වාහනය සඳහා ඉන්ධන ලීටර් 170ක් හෝ වෙළඳපොළේ පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව දීමනාවක්;

සහ

(ඊ) මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා හා සාමාජිකයින් වෙත, මැතිවරණයක් ප්‍රකාශයට පත් කළ දින සිට ප්‍රතිඵල නිකුත් කරන දින දක්වා වූ කාලසීමාව සඳහා ඔවුන්ගේ මාසික දීමනාවෙන් ¾ක විශේෂ දීමනාවක් ද.

ඊට අනුකූලව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් ස්වාධීන කොමිෂන් සභා නවයෙහි සභාපතිවරයන්ට හා සාමාජිකයින්ට ඉහත සඳහන් පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා,— කාර්මික ආරවුල් පනත යටතේ නියෝග,— කලින් කලට සංශෝධනය කරන ලද, 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ (131 වැනි අධිකාරය වූ) 39 වැනි වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016.07.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— “ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*12.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 213ඇ වගන්තිය සමඟ කියවියයුතු, එකී පනතේ 237 වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 දෙසැම්බර් 22 දිනැති අංක 1946/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*13.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*14.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*15.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**